**ශීර්ෂය 221 - කම්කරු දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 221 - කම්කරු දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූලි 13 දින කම්කරු කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

--------

**2.1 විසර්ජන ගිණුම**

-----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

-----------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 3,117.10 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 2,932.08 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 185.02 ක් හෙවත් සියයට 5.94 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 1,411.20 | 1,357.88 | 53.32 | 3.78 |
| මූලධන | 1,705.90 | 1,574.20 | 131.70 | 7.72 |
| **එකතුව** | **3,117.10** | **2,932.08** | **185.02** | **5.94** |

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 22101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 76.04 | 55.25 | 57.04 | 68.17 | 345.00 | 223.88 |

## 2.3 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0060/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 121.04 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ 2015 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 718 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0155/0102/000 | 717.70 |
| 6000/0000/00/0006/0029/000 | 0.31 |
| එකතුව | 718.01 |

## 2.5 විගණන නිරීක්ෂණය

කම්කරු දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබුණි.

### 3.2 විසර්ජන ගිණුම

#### 3.2.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 42 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5 ක සිට සියයට 89 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) වැය විෂයයන් 04 ක් වෙනුවෙන් අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා ප්‍රතිපාදන, පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ලබා ගැනීම නිසා, අදාළ ප්‍රතිපාදන උපයෝජනයන් කළ පසු ඉතිරිවීම්, ලබා ගෙන තිබුණු පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් ප්‍රතිපාදනයෙන් සියයට 12 ක සිට සියයට 89 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(ඇ) 2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් කම්කරු දෙපාර්තමේන්තුවේ සංවර්ධන ව්‍යාපෘතියක් වන සේවක අර්ථසාධක අරමුදල වෙත රු.මිලියන 557.74 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම සම්පූර්ණ ප්‍රතිපාදනයම උපයෝජනය කර තිබුණි. දෙපාර්තමේන්තුව විසින් සේවක අර්ථසාධක අරමුදලේ කටයුතු සඳහා වැය කරන මුදල් මාසිකව සේවක අර්ථසාධක අරමුදලින් ප්‍රතිපූර්ණය කර රජයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

### 3.3 පොදු තැන්පත් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ (ඉඩම් තැන්පතු හැර) එකතුව රු. 279,844,320 ක්වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 6000/0000/00/0006/0029/000 දරන ආගමන විගමන අරමුදලට අයත් තැන්පත් ගිණුමේ වර්ෂ කිහිපයක සිට පැවත එන රු.311,295 ක ශේෂය සම්බන්ධව තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂයය අංක 22101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වු සැසඳුම් ප්‍රකාශය අනුව, වර්ෂ 01 ක සිට වර්ෂ 36 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එන රු.2,663,614 ක් වූ හිඟහිට ණය ශේෂ අයකර ගැනිමට 2015 දෙසැම්බර් 31 දින වන විටත් දෙපාර්තමේන්තුව අපොහොසත් වි තිබුණි. එම ශේෂ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සභාවලට ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ අදාළ පළාත් සභාවලින් අයකර ගන්නා ලෙස 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ දක්වා තිබුණත්, දෙපාර්තමේන්තුව විසින් එසේ අයකළ යුතුව තිබුණු රු.50,777 ක ණය ශේෂ 2015 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වැඩ තහනම් කළ නිලධාරීන්ගේ, සේවය හැර ගිය නිලධාරීන්ගේ හා විශ්‍රාම ගිය නිලධාරීන්ගේ සමාලෝචිත වර්ෂය අවසාන වන විට අයවිය යුතු ණය ශේෂ විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි.

## 3.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.5.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 ජුලි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 3.6 බේරුම් නොකළ බැරකම්

දෙපාර්තමේන්තුව විසින් නිරවුල් කළ යුතුව තිබුණු 2015 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට වඩා අඩු කාලයක සිට පැවැත එන රු.9,840,540 ක්වූ බැරකම් විය.

## 3.7 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | |
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | දෙපාර්තමේන්තුව සතු වාහන 104 කින් වාහන 89 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. |
| (ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ | |
| 2015 ජුලි 10 දිනැති අංක 2/2015 දරන චක්‍රලේඛය | අපහරණය කළ යුතු බවට හඳුනා ගන්නා ලද වාහනය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපහරණය කර නොතිබුණි. |

## 3.8 කාර්යසාධනය

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) **ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

ප්‍රධාන කාර්යයන් බොහොමයක් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) **කාන්තා ළමා කටයුතු අංශය වෙත ලැබෙන පෙත්සම් හා පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරිම**

2011 අප්‍රේල් 29 දිනැති අංක 06/2011 දරන කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව කාර්යාලයට පැමිණිල්ලක් ලැබී දින 14 ක් ඇතුළත එය ප්‍රකාශ කර විසඳිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු පැමිණිලි 554 කින් පැමිණිලි 186 ක් විසඳා නොතිබුණු අතර එම පැමිණිලි ලැබී මාස 01 ක සිට මාස 34 ක් දක්වා කාල ප්‍රමාදයක් සිදු වී තිබුණි.

(ii) **සැලැසුම්, පුහුණු හා ප්‍රකාශන අංශයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කිරිම**

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව සැලසුම්, පුහුණු හා ප්‍රකාශන අංශය සැලැසුම් කෂේත්‍ර 04 කට අදාළව පාඨමාලාවන් 89 ක් පැවැත්වීමට සැලැසුම් කර තිබුණද, ඉන් පාඨමාලා 44 ක් පවත්වා නොතිබුණි.

(iii) **කාර්මික සබඳතා අංශයේ කාර්යසාධනය**

සේවය අවසන් කිරීමේ අංශය වෙත 2015 අගෝස්තු 31 දින වන විට යොමු වූ පැමිණිලි 197 කින් පැමිණිලි 38 ක් 2016 අගෝස්තු 01 දින වන විටත් විසඳා නොතිබුණි.

(ආ) කාර්මික ආරවුල් විසදීම

සමාලෝචිත වර්ෂයේදී වාර්තාගත කාර්මික ආරවුල් සංඛ්‍යාව 3,540 ක් වූ අතර ඉන් ආරවුල් 2,174 ක් පමණක් විසඳා තිබුණි. වර්ෂය අවසාන වන විට විසඳා නොතිබුණු ආරවුල් සංඛ්‍යාව 1,366 ක් විය.

(ඇ) ශ්‍රී ලංකාව ළමා ශ්‍රමයෙන් තොර කළාපයක් කිරීම

2015 අප්‍රේල් 02 දිනැති අංක 03/2015 දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව ශ්‍රී ලංකාව ළමා ශ්‍රමයෙන් තොර කලාපයක් බවට පත් කිරීමේ යෝජිත ව්‍යාපෘතිය ඉටු කර ගැනීම සඳහා 2015 අප්‍රේල් 04 දින රු.80,562 ක් වියදමක් කර නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරු, දිස්ත්‍රික් කාර්යාල භාර සහකාර කම්කරු කොමසාරිස්වරු සහ ජ්‍යෙෂ්ඨ කම්කරු නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වා තිබුණි. ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්, ග්‍රාම නිලධාරි, පරිවාස නිලධාරීන්, නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරු මගින් දැනුවත් කිරීමේ වැඩසටහන් 09 ක් රු.96,000 ක් වැය කරමින් පැවැත්වීමට සැලැසුම් කර තිබුණද, එය පවත්වා නොතිබුණි. ශ්‍රී ලංකාව ළමා ශ්‍රමයෙන් තොර කලාපයක් බවට පත් කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳ උපදෙස් ලබාදී 2015 ජූලි 31 දිනට ප්‍රථම එම ව්‍යාපෘතියේ ප්‍රගතිය වාර්තා කරන ලෙස දන්වා තිබුණද, 2016 ජූලි 31 දින වන විට අදාළ ප්‍රගතිය එක් නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරයෙකු පමණක් වාර්තා කර තිබුණි.

(ඇ) කාර්ය මණ්ඩලය පුහුණු කිරීම

-----------------------------------

සැලසුම්, පුහුණු හා ප්‍රකාශන අංශය මගින් වැඩසටහන් 07 කදී රු.453,300 ක් වැයකර නිලධාරීන් 350 ක් පුහුණු කිරීමට සැලැසුම් කර තිබුණද, අදාළ සියලු මුදල් වියදම් කර නිලධාරීන් 253 කට පමණක් පුහුණුව ලබා දී තිබුණි.

**3.9 අහිමි ශ්‍රමය**

**-------------**

කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්මික සබඳතා අංශයේ තොරතුරු අනුව 2015 දෙසැම්බර් 31 දින වන විට ලියාපදිංචි වී තිබූ වෘත්තීය සමිති සංඛ්‍යාව 1,907 ක් විය. සමාලෝචිත වර්ෂය හා ඊට පෙර වර්ෂයේදී වෘත්තීය සමිති හරහා වැඩවර්ජන සිදු කිරීම හේතුවෙන් රටට අහිමි වූ මිනිස් දින ගණන් පහත පරිදි විය.

| විස්තරය | 2015 | 2014 | වැඩිවීමේ ප්‍රතිශතය |
|---|---|---|---|
| වැඩවර්ජන ගණන | 51 | 38 | 34 |
| සහභාගී වූ සේවක සංඛ්‍යාව | 14,915 | 6,451 | 131 |
| පාඩු වූ මිනිස් දින ගණන | 82,294 | 37,323 | 120 |

මේ අනුව සමාලෝචිත වර්ෂයේ වැඩවර්ජන සඳහා සහභාගී වූ සේවක සංඛ්‍යාව සහ ඉන් රටට අහිමි වූ මිනිස් දින ගණන පෙර වර්ෂයට සාපේක්ෂව විශාල ප්‍රතිශතයකින් වැඩි වී තිබුණි.

**3.10 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

**----------------------------------------**

සමාලෝචිත වර්ෂයේදී පැවැත්වූ ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම සහ ශ්‍රී ලංකාව ළමා ශ්‍රමයෙන් තොර කලාපයක් බවට පත්කිරීම පිළිබඳ වූ වැඩසටහන 2015 මාර්තු 08 දින කම්කරු මහ ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේ පවත්වා තිබූ අතර ඒ සඳහා ආහාර පාන සපයා ගැනීමේදී කූට ලේඛන ඉදිරිපත් කර රු.177,000 ක මුදලක් වංචාකර තිබුණි.

**3.11 පාඩු හා හානි**

**--------------**

2002 ජනවාරි 01 දින පැපිලියානේදී සොරුන් විසින් පැහැරගත් රු.800,000 කට තක්සේරු කළ වාහනය 2015 දෙසැම්බර් 31 දින වන විටත් සොයා ගැනීමට නොහැකි වී තිබුණි.

**3.12 කළමනාකරණ දුර්වලතා**

--------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය විසින් සිදුකරන පාඨමාලා සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 06 ක් වැය කර තිබුණි. නමුත් නිලධාරීන්ට පුහුණු පාඨමාලා ලබාදීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. එමෙන්ම පාඨමාලා සඳහා දායකත්වය ලබාගත් නිලධාරීන්ගෙන් පාඨමාලා සාර්ථක ලෙස සම්පූර්ණ කළ බව සනාථ වන සහතික ලබා ගෙන නොතිබුණි.

(ආ) 2007 දෙසැම්බර් මාසයේදී රු. මිලියන 21.88 ක් වැය කර උපකොටස් 7කින් සමන්විත හයිඩල්බෙර්ජ් (HEIDELBERG – GT052-1) මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). මුද්‍රණ කටයුතු සඳහා එම යන්ත්‍රයේ උපකොටස් 02 ක් පමණක් භාවිත කර තිබුණි. එය මුළු යන්ත්‍රයේ ධාරිතාවයෙන් සියයට 10 ක් පමණක් විය. මෙම සියළු යන්ත්‍ර කොටස් 2013 වර්ෂයෙන් පසුව සේවා කර නොතිබුණි.

(ii). එකතුව රු.6,286,034 ක් වටිනා යන්ත්‍රයේ කොටස් අනාරක්ෂිතව මුද්‍රණාල ගොඩනැගිලි පරිශ්‍රයේ ගබඩා කර තිබුණු අතර ඒවා දිරා පත්වෙමින් තිබුණි.

(iii). මෙම මුද්‍රණ යන්ත්‍රය මගින් දෙපාර්තමේන්තුවේ මුද්‍රණ අවශ්‍යතාවයෙන් 2013 හා 2014 වර්ෂවල පිළිවෙලින් සියයට 56.5 ක් හා සියයට 63 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි.

(iv). පිරිවැය රු.3,194,652 ක් වූ මුද්‍රණ තහඩු සැකසුම (Plate Maker) හා ස්වයංක්‍රීය මුද්‍රණ තහඩු සැකසුම් (Automatic Plate Processor) යන්ත්‍ර නිෂ්කාර්යව පැවතීම නිසා අදාළ අවශ්‍යතාවයන් බාහිර ආයතන මගින් මුදල් ගෙවා ඉටුකරගෙන තිබුණි. මුද්‍රණ තහඩු සෑදීමට මිලට ගත් තහඩු 50 ක් හා රසායන ද්‍රව්‍ය (Developer LSP 19) ලීටර් 24 ක් භාවිතයට නොගෙනම කල් ඉකුත් වී තිබුණි.

(v). වාර්ෂික අවශ්‍යතාවය 700,000 - 900,000 ක් පමණ වන ඒබීඑච්(ABH) ආකෘති පත්‍ර රාජ්‍ය සංස්ථාවකින් මුද්‍රණය කරවාගෙන සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 8කදී රු.15,949,884ක් ගෙවා තිබුණි. මෙම ආකෘති පත්‍ර මුද්‍රණයට අවශ්‍ය සිදුරු සැකසීමේ උපාංගය මිලදී ගෙන තිබුණේ නම් මෙම මුද්‍රණ යන්ත්‍රයෙන්ම ඒවා මුද්‍රණය කරගත හැකිව තිබූ බව දෙපාර්තමේන්තු විදුලි ඉංජිනේරුවරයා පවසා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එය මිලට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේ මුල් මාස 08 තුළදී කම්කරු කොමසාරිස් විසින් නිකුත් කරන ලද නියෝග වල වටිනාකම රු.97,450,568 ක් විය. ඉන් සියයට 25.3 ක් එනම් රු.24,659,968 ක් අයකර තිබූ අතර, සියයට 74.7 ක් එනම් රු.72,790,600ක් අයකර ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

(ඈ) 2003 අංක 13 දරන කාර්මික ආරවුල් පනත අනුව කාර්මික ආරවුලක් විසඳීම සඳහා තීරකයෙකු වෙත යොමු කර මාස 03 ක් ඇතුළත විසඳීම සිදු කළ යුතු වුවත් විගණන පරීක්ෂාවට භාජනය කළ යොමු කිරීම් 16 කින් 13 ක් විසඳීම සඳහා වර්ෂ 03 ක සිට වර්ෂ 09 ක් දක්වා දීර්ඝ කාලයක් ලබාගෙන තිබුණි.

(ඉ) සේවායෝජකයින් විසින් තම සේවකයින්ට ලබා දිය යුතු ව්‍යවස්ථාපිත වැටුප් හෝ සේවක අර්ථසාධක, අයවැය දීමනා යනාදී ව්‍යවස්ථාපිත දීමනා නොගෙවීම්, අඩුවෙන් ගෙවීම් හෝ වෙනත් හේතූන් මත සේවාදායකයන්ට අයකර දීමේ අරමුණින් දිවයිනේ අධිකරණ වෙත පැවරූ වටිනාකම රු.29,156,975,557 ක්වූ නඩු 15,304 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම නොකර පැවැතුණි.

(ඊ) සේවක අර්ථසාධක අරමුදල් සාමාජිකයන්ගේ ගිණුම් ශේෂය සාමාජිකයන්ට පරීක්ෂා කරගත හැකිවන කියෝස් )Kiosks 14,917,500 .ක් රු 30 යන්ත්‍ර (කට මිලදී ගැනීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 මාර්ගෝපදේශය ප්‍රකාර කාල රාමුවක් සකස් කර නොතිබුණි6.එවැනි කාල රාමුවක් නොතිබීම නිසා රු .,627, කට 309මිලදීගත් යන්ත්‍ර ක් 14 .ස්ථාපිත කිරීමේ දී විශාල කාල පමාවක් සිදුව තිබුණි

(උ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට වෘත්තීය විෂමාචාරයන් හේතුවෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශනයෙන් හෝ වෙනත් හේතු මත නිලධාරීන් 09

දෙනෙකුගේ වැඩ තහනම් කර තිබූ අතර ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 31.6 ප්‍රකාරව මෙම නිලධාරීන් සඳහා අප්‍රමාදව මූලික පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. නිලධාරීන් 03 දෙනෙකු සඳහා මූලික විමර්ශන නිලධාරීන් පමණක් පත්කර තිබුණි. 2016 මැයි 30 දින වන විට නිලධාරීන් දෙදෙනෙකුගේ වැඩ තහනම් කර තිබූ අතර අදාල මූලික විමර්ශන කටයුතු පවත්වා නොතිබුණි.

**(ඌ) කම්කරු පරීක්ෂණ පැමිණිලි හා නඩු කටයුතු පරිගණකගත කිරීමේ වැඩසටහන (LISA) ක්‍රියාත්මක කිරීම**

2014 මැයි 13 දිනැති අංක 01(1)/2014 දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛයෙන් සංශෝධිත 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව ඉහත වැඩසටහන සාර්ථක කර ගැනීමට රු.39,091,100 ක් වැයකර කම්කරු නිලධාරීන්, සහකාර කම්කරු කොමසාරිස්වරුන් වෙත තල පරිගණක (Tablet ) හා ස්වයංක්‍රීය රැහැන් රහිත දුරකථන (wifi) සන්නිවේදන උපකරණ බෙදා දී තිබුණු අතර ඒ සඳහා වියදමක් කර පුහුණුවීම්ද ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). බොහොමයක් කම්කරු නිලධාරීන් විසින් මෙම වැඩසටහන් යටතේ ලබාදුන් තල පරිගණක නිල රාජකාරී කටයුතු සඳහා භාවිතා කර නොතිබූ අතර විවිධ දෝෂයන් නිවැරදි කර ගැනීම සඳහා අවස්ථා 62 කදී ප්‍රධාන කාර්යාලයේ ගබඩාව වෙත යොමු කර අලුත්වැඩියා කරවාගෙන තිබුණි.

(ii). වෘත්තීය සමිති ක්‍රියාමාර්ග මත කම්කරු නිලධාරීන් දෙපාර්තමේන්තු දත්ත පද්ධතියට ඇතුළත් කිරීම ප්‍රතික්ෂේප කිරීම මත ඊට කළමනාකරණ සහකාරවරුන් සහභාගී කර ගැනීම වෙනුවෙන් 2015 වර්ෂයේදී එම නිලධාරීන් පුහුණු කිරීම සඳහා රු.204,540 ක් වැය කර තිබුණි.

(iii). 2015 වර්ෂයේදී ප්‍රසම්පාදන සැලැස්ම මගින් විවිධ අවශ්‍යතා සඳහා ලබා ගැනීමට සැලැසුම් කළ පරිගණක 200 කින් රු.13,136,645 ක් වටිනා පරිගණක 89 ක් කම්කරු පරීක්ෂණ පැමිණිලි හා නඩු කටයුතු පරිගණකගත කිරීමේ (LISA) ව්‍යාපෘතියේ තොරතුරු ජාලගත කිරීම සඳහා කළමනාකරණ සහකාරවරුන්ගේ ප්‍රයෝජනයට කම්කරු කාර්යාල වෙත ලබා දී තිබුණි.

(iv). කම්කරු පරීක්ෂණ පැමිණිලි හා නඩු කටයුතු පරිගණකගත කිරීමේ (LISA) පද්ධතියට 2015 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු තොරතුරක් ඇතුළත් නොකළ කම්කරු කාර්යාල 28 ක් පැවතුණි.

## 3.14 මානව සම්පත් කළමනාකරණය

**(අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 205 | 142 | 63 | - |
| (ii) | තෘතියික මට්ටම | 668 | 400 | 268 | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| (iii) | ද්විතියික මට්ටම | 1,771 | 1,429 | 342 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 483 | 429 | 54 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 3 | - | 03 |
| | | ------- | ------- | ------ | ----- |
| | එකතුව | 3,127 | 2,403 | 727 | 03 |
| | | ==== | ==== | ==== | == |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත කාර්ය මණ්ඩලයෙන් පුරප්පාඩු 727 ක් පැවතුණි. දෙපාර්තමේන්තුව විසින් එම පුරප්පාඩු විධිමත් පරිදි පිරවීමට කටයුතු කර නොතිබුණි. කෙසේ නමුදු විධිමත් අනුමැතියකින් තොරව සේවකයින් 03 දෙනෙක් අනියම් කාර්ය මණ්ඩලය ලෙස බඳවා ගෙන තිබුණි.

(ආ) **අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

-------------------------------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී වෙනත් පාර්ශවයන්ට අවිධිමත් ලෙස නිලධාරීන් 13 දෙනෙකු මුදාහැර තිබුණි.